02006

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන
අවසාන පරීක්ෂණය - 2024/2025
**STP8404/STP8504/ESP2204** - අධ්‍යාපනයේ තාක්ෂණික පදනම
කාලය - පැය තුනයි (03)

---

දිනය - 2025.05.04 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ.
- සිසුන් I කොටසේ සියලුම ප්‍රශ්නවලට සහ II කොටසේ (09-12) ඕනෑම ප්‍රශ්න දෙකකට සහ III කොටසේ (13-16 විශේෂ ක්‍රම) ඕනෑම ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතුයි.
- සමස්තයක් වශයෙන්, සිසුන් ප්‍රශ්න 16 න් ප්‍රශ්න 12 කට පිළිතුරු සැපයිය යුතුයි.
- පිළිතුරු පත්‍රයේ මුල් පිටුවේ ඉහළ දකුණු කෙළවරේ විශේෂ ක්‍රම සඳහා තෝරා ගත් විෂයය (III කොටස සඳහා තෝරා ගත්) පැහැදිලිව සඳහන් කළ යුතුය.

## I වන කොටස

1. "තාක්ෂණය පිළිබඳ ඉගෙනීම", "තාක්ෂණය තුළින් ඉගෙනීම" සහ "තාක්ෂණය සමඟ ඉගෙනීම" අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

2. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තොරතුරු යවන්නා හා ග්‍රාහකයා අතර සිදු වන සන්නිවේදන චක්‍රයක් ලෙස දැකිය හැකිය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට ඔබට භාවිත කළ හැකි ක්‍රම පහක් (05) සඳහන් කරන්න.

3. අධ්‍යාපනයේ දී උත්පාදක කෘත්‍රිම බුද්ධිය (GenAI) මේ වන විට වැඩි වශයෙන් භාවිත වේ. ඔබේ ඉගැන්වීමේදී භාවිත කළ හැකි GenAI මෙවලම් දෙකක් (02) නම් කර පන්ති කාමරය තුළ මෙම මෙවලම් භාවිත කිරීමේදී ඔබ අනුගමනය කළ යුතු ආචාර ධර්ම පිළිවෙත් තුනක් (03) සඳහන් කරන්න.

4. "අර්ථවත් ඉගෙනීම" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර, ඔබේ සිසුන් අතර අර්ථවත් ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ඔබ භාවිත කරන උපාය මාර්ග හතරක් (04) සඳහන් කරන්න.

5. ඉගැන්වීම ඵලදායී වීම සඳහා පාඩම් සැලැස්මක් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. හොඳින් සංවර්ධනය කරන ලද පාඩම් සැලැස්මක් සාර්ථකව පාඩමක් ඉගැන්වීම සඳහා උපකාරී වන ආකාර පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

6. "ඉගෙනුම් ඵල" යන පදය නිර්වචනය කර, ඔබ උගන්වනු ලබන විෂයයේ පාඩමක් සඳහා ඉගෙනුම් ඵල ලිවීමේදී සලකා බැලිය යුතු අංශ හතර (04) උදාහරණයක් සමඟ කෙටියෙන් විස්තර කරන්න.

7. ඉගැන්වීම සඳහා නව තාක්ෂණය ඒකාබද්ධ කිරීමේදී ඔබ අත්විඳ ඇති අභියෝග තුනක් (03) හඳුනා ගන්න.එක් එක් අභියෝගය ජය ගැනීම සඳහා එක් (01) ප්‍රායෝගික විසඳුමක් බැගින් යෝජනා කරන්න.

8. "ඩේල්ගේ අත්දැකීම් කේතුව" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර, ඔබේ පාඩම් සැලසුම් කිරීමේදී එය භාවිත කිරීමේ වාසි හතරක් (04) දක්වන්න.

(ලකුණු 05x08 = ලකුණු 40)

## <u>II වන කොටස</u>

9. i. ශිෂ්‍ය කේන්ද්‍රීය පන්ති කාමර සඳහා සහයෝගී ඉගෙනීමේ ප්‍රතිලාභ දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. ඔබ උගන්වන විෂයයකින් පාඩමක් තෝරාගෙන සියලුම සිසුන් අතර සම සහභාගීත්වයක් සහතික කිරීම සඳහා කාර්යයන් නිශ්චිතව දක්වමින් සහයෝගී ඉගෙනුම් ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න. (ලකුණු 05)

iii. ඔබේ පාඩමේ සහයෝගී ඉගෙනුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි ගැටලු දෙකක් (02) සහ ඔබ ඒවාට මුහුණ දෙන ආකාරය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු: 15)

10. i. ගුරුවරයෙකු ඉගෙනුම් - ඉගැන්වීම් ආධාරක තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. විවිධ වර්ගයේ ඉගැන්වීම් ආධාරක වර්ගීකරණය කර උදාහරණ සපයමින් එක් එක් වර්ගය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. "ඉගෙනුම් - ඉගැන්වීම් ආධාරක යනු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී යොදා ගන්නා අමතර හෝ අතිරේක මෙවලම් පමණක් නොවන අතර එය සිසුන් අතර දැනුම ගොඩනැගීමට සහාය වන අත්‍යවශ්‍ය සංරචකයක්ද විය යුතුය". සුදුසු උදාහරණ තුනක් (03) සහාය කරගනිමින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු: 15)

11. i. 21 වන සියවසේ ඉගෙනුම් කුසලතා හතර (4Cs) විස්තර කර සමකාලීන අධ්‍යාපනය සඳහා එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. ඔබ උගන්වන විෂයයකින් පාඩමක් තොරා ගෙන, සිසුන් අතර 4Cs සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණය ඒකාබද්ධ කරන ආකාරය, නිශ්චිත උදාහරණ සපයමින් විස්තර කරන්න. (ලකුණු 05)

iii. ඔබේ පන්ති කාමරයේ සිසුන් අතර 4Cs වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණය ඒකාබද්ධ කිරීමේදී ඔබට මුහුණ දීමට සිදුවිය හැකි ප්‍රධාන අභියෝග තුනක් (03) සඳහන් කර, මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා ක්‍රියාකාරී උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු: 15)

12. i. ඔබේ පන්ති කාමර සැකසුම තුළින් උදාහරණ සපයමින් "සමස්ත පන්තියට ඉගැන්වීම" සහ "කණ්ඩායම් ඉගැන්වීම" යන සංකල්ප දෙක පැහැදිලි කර එම සංකල්ප දෙක අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

ii. ගුරුවරයෙකු ලෙස, කණ්ඩායම් ඉගැන්වීම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ භාවිත කරන උපාය මාර්ග හතරක් (04), එම එක් එක් උපාය මාර්ගය සඳහා ඔබේ සැබෑ පන්ති කාමර සැකසුමෙන් උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

iii. කණ්ඩායම් ඉගැන්වීම භාවිත කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන පොදු අභියෝග තුනක් (03) ලැයිස්තු ගත කර ඒවා ජය ගැනීම සඳහා ප්‍රායෝගික විසඳුම් යෝජනා කරන්න. උදාහරණ සමඟ ඔබේ විසඳුම් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු: 15)

## <u>III වන කොටස</u>

13. i. තාක්ෂණික, ශික්ෂණ ශාස්ත්‍රීය, සහ අන්තර්ගත දැනුම පිළිබඳ (TPACK) රාමුවේ ප්‍රධාන සංරචක තුනක් දක්වමින් TPACK සංකල්පය කෙටියෙන් විස්තර කර ඔබේ විෂයය ඵලදායී ලෙස ඉගැන්වීමේදී එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

ii. ඔබේ විෂයයෙන් පාඩම් මාතෘකාවක් තෝරාගෙන TPACK රාමුව මත පදනම්ව පාඩම් සැලැස්මක් සැලසුම් කර, TPACK හි ප්‍රධාන සංරචක තුන ( i. හි සඳහන් කරන ලද) ඔබේ පාඩමට ඒකාබද්ධ කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. (ii) කොටසේ විස්තර කර ඇති ඔබේ පාඩමේ TPACK ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි අභියෝග දෙකක් (02) සඳහන් කර මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා ප්‍රායෝගික විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු: 15)

14. i. COVID-19 වසංගතයෙන් පසු ගුරුවරුන් සහ පාසල් සිසුන් අතර දුරස්ථ ඉගෙනුම් ක්‍රියාකාරකම් ජනප්‍රිය විය. ඔබ උගන්වන විෂයයට අදාළව දුරස්ථ ඉගෙනීම සඳහා ඔබේ සිසුන් සමඟ භාවිත කළ හැකි වීඩියෝ සම්මන්ත්‍රණ මෙවලම් (video conferencing tools) දෙකක් සහ මාර්ගගත තක්සේරු මෙවලම්(online assessment tools) දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. වීඩියෝ සම්මන්ත්‍රණ මෙවලම් භාවිතයෙන් මාර්ගගත පාඩම් පැවැත්වීමේදී සිසුන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා භාවිත කළ හැකි උපාය මාර්ග පහක් **(05)** විස්තර කරන්න. (ලකුණු 05)

iii. මාර්ගගත ඉගැන්වීම සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ මෙවලම් භාවිත කිරීමේදී ඔබට මුහුණ දීමට සිදු විය හැකි අභියෝග තුනක් **(03)** ලැයිස්තුගත කර, ඔබේ සිසුන්ට සුමට ඉගෙනුම් අත්දැකීමක් සහතික කිරීම සඳහා ඔබ එම අභියෝග අවම කරගන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු: 15)

15. i. ව්‍යාපෘති පාදක ඉගැන්වීමේ ක්‍රමය නිර්වචනය කර සාම්ප්‍රදායික උපදේශන ක්‍රමවලින් වෙන් කර හඳුනා ගත හැකි ප්‍රධාන ලක්ෂණ තුනක් **(03)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

ii. ඔබේ විෂයයයෙන් පාඩමක් තෝරා ගෙන, මැනිය හැකි ඉගෙනුම් ඵල, ශිෂ්‍ය ඉගෙනුම් ක්‍රියාකාරකම් සහ සුදුසු තක්සේරු ක්‍රම ඇතුළත් ව්‍යාපෘති පාදක ඉගෙනුම් අත්දැකීමක් සැලසුම් කරන්න. (ලකුණු 06)

iii. ඉහත සඳහන් කළ ඉගෙනුම් අත්දැකීම ක්‍රියාත්මක තිරීමේදී ඔබට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග දෙකක් **(02)** සාකච්ඡා කර ඒවා ජය ගැනීම සඳහා නිශ්චිත උපායමාර්ග යෝජනා කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු: 15)

16. i. "නිර්මාණාත්මක අර්ථකාරී පෙළගැස්ම" යන සංකල්පය පැහැදිලි කර, ඔබේ සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කිරීමේදී එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. ඔබේ විෂයයෙන් පාඩම් මාතෘකාවක් තෝරා ගෙන ඔබේ පාඩම තුළ නිර්මාණාත්මක අර්ථකාරී පෙළගැස්ම පිළිබිඹු කරන සවිස්තරාත්මක ඉගෙනුම් අත්දැකීමක් සැලසුම් කරන්න. (ලකුණු 06)

iii. මෙම පාඩම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි අභියෝග දෙකක් **(02)** විස්තර කර ඒවා ජය ගැනීම සඳහා ප්‍රායෝගික විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු: 15)

-සියලුම හිමිකම් ඇවිරිණි.-